# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2137/91 – 2019 අගෝස්තු මස 23 වැනි සිකුරාදා – 2019.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

LAND/MP/3275.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමය යටතේ යෝජිත බස්නාගොඩ ජලාශය ඉදිකිරීමෙන් බලපෑමට ලක්වන අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පවුල් නැවත පදිංචි කිරීමට ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අගෝස්තු මස 15 වැනි දින,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 35, ''ලක්දිය මැදුර'',
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5/2/3/1481

1A – G 30820 – 18 (2019/08)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 363, වැලිකඩමුල්ල ග්‍රාම නිලධාරී වසමේ වැලිකඩමුල්ල ගමේ පිහිටි මේ සමග එවන අංක GA/ATT/2017/475 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර B, D සහ C කැබැල්ලෙන් කොටසක් ලෙස පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් අක්කර 3.26ක් පමණ වන සපුගස්ඕවිට නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් තුන.

*කැබලි අක්ෂර* : B
*ඉඩමේ නම* : සපුගස්ඕවිට
*ප්‍රමාණය* : හෙක්ටයාර 0.3094

*උතුරට* : පාර, කේ. කේ. අනිල් සුරවීර මහතා හිමිකම් කියන පුංචි නාමලේ සහ කැබලි අක්ෂර A;
*නැගෙනහිරට* : කැබලි අක්ෂර A, කුරුණෑගල වැවිලි සමාගම හිමිකම් කියන සපුගස්ඕවිට සහ කැබලි අක්ෂර A;
*දකුණට* : කුරුණෑගල වැවිලි සමාගම හිමිකම් කියන සපුගස්ඕවිට, කැබලි අක්ෂර A සහ මාර්ගය;
*බටහිරට* : කුරුණෑගල වැවිලි සමාගම හිමිකම් කියන සපුගස්ඕවිට, කැබලි අක්ෂර E, D, කුරුණෑගල වැවිලි සමාගම හිමිකම් කියන සපුගස්ඕවිට, පාර, කුරුණෑගල වැවිලි සමාගම හිමිකම් කියන සපුගස්ඕවිට, කැබලි අක්ෂර C, F, C සහ කුරුණෑගල වැවිලි සමාගම හිමිකම් කියන සපුගස්ඕවිට.

*ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය :*

01. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම,
තැ. පෙ. 25,
අංක 80, දඹුල්ල පාර,
කුරුණෑගල.

*කැබලි අක්ෂර* : D
*ඉඩමේ නම* : සපුගස්ඕවිට
*ප්‍රමාණය* : හෙක්ටයාර 0.4010

*උතුරට සහ නැගෙනහිරට* : කැබලි අක්ෂර B (පාර);
*දකුණට* : කැබලි අක්ෂර E;
*බටහිරට* : කුරුණෑගල වැවිලි සමාගම හිමිකම් කියන සපුගස්ඕවිට.

*ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය :*

01. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම,
තැ. පෙ. 25,
අංක 80, දඹුල්ල පාර,
කුරුණෑගල.

*කැබලි අක්ෂර* : C කැබැල්ලෙන් කොටසක්
*ඉඩමේ නම* : සපුගස්ඕවිට
*ප්‍රමාණය* : හෙක්ටයාර 0.6089

*උතුරට* : කැබලි අක්ෂර C හි ඉතිරි කොටස;
*නැගෙනහිරට* : කැබලි අක්ෂර B (පාර);
*දකුණට* : කැබලි අක්ෂර F සහ කැබලි අක්ෂර B (පාර);
*බටහිරට* : කැබලි අක්ෂර B (පාර).

*ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය :*

01. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම,
තැ. පෙ. 25,
අංක 80, දඹුල්ල පාර,
කුරුණෑගල.

09 - 245

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.